www.kidworship.kr

# හන්නා සහ සාමුවෙල්

- 21st Story-



149Page



150Page

පොතේ ගුරා   එල්කානා නම් මනුෂ්‍යයෙක් ඉශ්රායෙල්හි ජීවත් වුණා. ඔහුට භාර්යාවන් දෙදෙනෙක් සිටියා. එක් තැනැත්තියක් හන්නා ය. අනෙක් තැනැත්තිය පෙනින්නාය. පෙනින්නාට දරුවන් සිටි නමුත් හන්නාට සිටියේ නැත.
ඒ නිසා පෙනින්නා නිතරම හන්නා ව කෝප කෙරෙව්වාය.
නමුත් එල්කානා වැඩි වැඩියෙන් හන්නාට ආදරේ වීය.
මෙය දැනගත් පෙනින්නා හන්නා හඬවන තරමට ඇයව රිදෙව්වාය.

පෙනින්නා   ඒයි මෝඩි... ඔයාට ළමයි හදන්නවත් බෑ.

පොතේ ගුරා   හන්නා බොහෝ වේදනාවට පත්ව සිටියා. ඇයට දරුවන් නොමැති නිසා.
ඇය නොකා නොබී හඬමින් කාලය ගත කළා.
ඇයගේ සැමියා වූ එල්කානා ඇය සැනසීමට කොපමණ උත්සහ කළත් ඇයගේ හදවත නිතරම බිඳී තිබුණා.

..........................................................................................

පොතේ ගුරා   හන්නා හඬමින් දේවමාලිගාවට ගොස් ඇයගේ මුලු ආත්මයෙන් ම ශෝකව, පීඩිතව දෙවියන්වහන්සේට යාච්ඤා කරන්නට පටන් ගත්තාය.

හන්නා   ස්වාමිනි ඉහිහි.... ඉහිහිහි (හන්නා හඬයි) ....
මා දෙස බලන්න.. අනේ මට කරුණාව දක්වන්න..
මා අසරණ කාන්තාවක්.... අනේ ස්වාමිනී......
මට පිරිමි දරුවෙකු දෙන්නේ නම්, මම ඔහුගේ ජීවිතයේ සියලුම දවස්වල ඔහුව ඔබටම නැවත දෙන්නෙමි.

පොතේ ගුරා   හන්නා ස්වාමින්වහන්සේ ඉදිරියේ බොහෝ වේලා යාච්ඤා කළාය.
ඇය යාච්ඤා කරද්දී ඒලි පූජකයා දේවමාලිගාවට ඇතුල් වුණා.
හන්නා තමාගේ සිත තුළම කතා කළාය. ඇගේ තොල් පමණක් සෙළවුණේය.  ඇගේ කට හඬ ඇසුණේ නෑ.
ඒ නිසා ඇය බීලා මත් වෙලාදෝ කියා ඒලි පූජකයා සිතුවා.

ඒලි   නුඹ කොපමණ කල් බීලා මත් වී සිටිනවා ද? නුඹේ මුද්‍රිකපානය නුඹෙන් පහකරන්න.

හන්නා   මගේ ස්වාමිනි, මම මුද්‍රිකපානයවත් සැරබීමවත් බීලා නෑ.
මම ශෝක සිතක් ඇති ස්ත්‍රියක්ය. ස්වාමින්වහන්සේ ඉදිරියේ මාගේ ආත්මය වැගුරුවෙමි.

පොතේ ගුරා   හන්නාගේ කතාව ඇසූ ඒලි පූජකයා හන්නාට ආශිර්වාද කළා.

ඒලි   සමාදානයෙන් යන්න. ඉශ්රායෙල්ගේ දෙවියන්වහන්සේගෙන් නුඹ කළ ඉල්ලීම උන්වහන්සේ  නුඹට ඉෂ්ට කර දෙනවා ඇත.

පොතේ ගුරා   හන්නා බොහෝ සමාදානයෙන් පිටත් වී ගියා. ඇය නැවතත් කණගාටු වූයේ නෑ. ඇය සතුටින් කෑම කා බී ජීවත් වුණා.



151Page

පොතේ ගුරා — දෙවියන්වහන්සේ හන්නාව සිහි කළා. තවද අවුරුද්දක් ගිය කළ හන්නා පුත්‍රයෙකු බිහි කළා. ඔහුගේ නම සාමුවෙල්. හන්නා සාමුවෙල් බොහෝ සේ ආදරේ චුණා. ඔහු ඉතාම නිවැරදිව හදා වඩා ගත්තා.
සාමුවෙල්ට තනියම දේවල් කර ගන්න පුලුවන් වෙද්දී ඇය ඔහුව දෙවියන්වහන්සේට වූ පොරොන්දුව ඉටු කිරීම පිණිස ගොස් දේවමාලිගාවට බාර දුන්නා.

හන්නා — මාගේ ස්වාමිනි, මෙහි ඔබ ළග ස්වාමින්වහන්සේට යාච්ඤා කරමින් සිටි ස්ත්‍රිය මමයි. මේ දරුවා ලබාගන්ට යාච්ඤා කළෙමි. ස්වාමින්වහන්සේ ද මා ඉල්ලූ දේ මට දුන්සේක. ඒ නිසා මමත් ඔහු ස්වාමින්වහන්සේට දුනිමි. ඔහු ජීවත්ව සිටින තෙක් ස්වාමින්වහන්සේට කැප කරමි.

පොතේ ගුරා — හන්නා ස්වාමින්වහන්සේට නමස්කාර කරමින් ස්තුති දෙමින් ප්‍රීතිමත් චුණා.

..............................................................................................



152Page

පොතේ ගුරා — සාමුවෙල් නම් ළමයා ඒලි සමග දේවමාලිගාවේ ස්වාමින්වහන්සේට සේවය කළා. දෙවියන්වහන්සේ හන්නාට ආශිර්වාද කළ අතර ඈ ගර්භනීව පුත්‍රයන් 3 දෙනෙක් සහ දුවරුන් දෙදෙනෙක් බිහි කළා.

..............................................................................................



153Page

පොතේ ගුරා — සාමුවෙල් දෙවියන්වහන්සේගේ අභිමුඛයේ හැදී වැඩුණේය.
සාමුවෙල් ස්වාමින්වහන්සේගේ පෙට්ටිය තබා තිබුණා වූ මාලිගාවේ නිදා සිටිද්දී එක්තරා රාත්‍රියක දී සාමුවෙල්ට නුපුරුදු හඬක් ඇසුණා.

දෙවියන්වහන්සේ — සාමුවෙල්... සාමුවෙල්...

..............................................................................................



154Page

පොතේ ගුරා — සාමුවෙල් ඒලි පූජකයා ළගට දුවගෙන ගියා.

සාමුවෙල් — මාගේ ස්වාමිනි, මම මෙහිය. ඔබ මට කතා කළා ද ?

ඒලි — නෑ මගේ දරුවා. මම ඔබට කතා කළේ නෑ. ගිහින් නිදා ගන්න.

පොතේ ගුරා — සාමුවෙල් නැවත දේවමාලිගාවට හැරී ගියා.

දෙවියන්වහන්සේ — සාමුවෙල්... සාමුවෙල්...

පොතේ ගුරා — නැවතත් සාමුවෙල්ට මාගේ නම කතා කරනවා ඇසුණා.
නැවතත් සාමුවෙල් ඒලි ළගට දුවගෙන ගියා.

..............................................................................................



155Page

සාමුවෙල් — මගේ ස්වාමිනි, මම මෙහිය. ඔබ මට කතා කළා ද ?

ඒලි — නෑ මගේ දරුවා. මම කතා කළේ නෑ. ගිහින් නිදා ගන්න.

පොතේ ගුරා — නැවතත් සාමුවෙල් දේවමාලගිාවට ගොස් නිදා ගත්තා.

දෙවියන්වහන්සේ — සාමුවෙල්... සාමුවෙල්...

පොතේ ගුරා — සාමුවෙල් නම කියනවා ඔහුට නැවතත් ඇසුණා.

සාමුවෙල් — ඒලි පූජකතුමනි !

ඒලි — අයියෝ.... මම මේ නිදාගන්න හදනකොටම ඔයා එනවා.

පොතේ ගුරා — මේ ළමයට දෙවියන්වහන්සේ කතා කරන බව ඒලිට වැටහුණා.

ඒලි — හ්ම්... සාමුවෙල් ගිහින් නිදාගන්න.
නැවතත් මේ වගේ කතා කරනවා ඇහුණොත් මෙහෙම කියන්න.
" කතා කරන්න ස්වාමිනි... ඔබේ දාසයා අසා සිටිනවා "



156Page



157Page

| | |
|---|---|
| පොතේ ගුරා | සාමුවෙල් නැවතත් දේවමාලිගාවට ගියා. නැවතත් ඒ හඬින් කතා කළා. |
| දෙවියන්වහන්සේ | සාමුවෙල්... සාමුවෙල්... |
| සාමුවෙල් | කතා කරන්න ස්වාමිනි... මම අසා සිටිනවා. |
| පොතේ ගුරා | ඒ දවසේ සිට දෙවියන්වහන්සේ සාමුවෙල් සමඟ කතා කරන්නට පටන් ගත්තා. සාමුවෙල් ප්‍රොපේතවරයෙක් බවට මෙයින් හැමදෙනාටම අවබෝධ වෙන්නට පටන් ගත්තා.<br>ඔහු දෙවියන්වහන්සේම නියම කළ ප්‍රොපේතවරයෙකි. |

.............................................................................................

| | |
|---|---|
| පොතේ ගුරා | දෙවියන්වහන්සේ සාමුවෙල් සමඟ කතා කරන සියලු දේ ඉශ්රායෙල් ජනතාව සමඟ බෙදාගත්තා. සාමුවෙල් දිගු කාලයක් දෙවියන්වහන්සේට සේවය කළා. ඉශ්රායෙල් ජනතාවට මගපෙන්වීම් ලබා දෙමින් ඔවුන්ව මෙහෙයවන්නට සාමුවෙල් වැඩ කළා.<br>එසේම දෙවියන්වහන්සේ බොහෝ රජවරුන් සාමුවෙල් තුළින් අභිෂේක කරනු ලැබුවා. සාමුවෙල් ඉතාම උතුම් මිනිසෙකි. ඔහු ඉශ්රායෙල් ජනයාට දෙවියනව්හන්සේගේ වචනය උච්චාරණය කිරීමට තෝරාගත් දෙවියන්වහන්සේගේ හඬක් වූ මිනිසෙකි. |

.............................................................................................

| | |
|---|---|
| ජිවිතයට අදාල කිරීම | ආදර දෙව්පියාණෙනි. ඔබවහන්සේ පුංචි ළමයිත් එක්කත් කතා කරනවා නේද? හරිම පුදුමයි. මමත් පුංචි ළමයෙක්. |
| යාච්ඤාව | මට ආසයි ඔබවහන්සේ එක්ක කතා කරන්න.<br>සාමුවෙල්ට වගේම ඔබවහන්සේ මටත් කතා කරන්න.<br>ඔබවහන්සේ කතා කරන ආකාරය තේරුම් ගන්නට කුඩා කල පටන් මටත් පුරුදු කරන්න. යේසුස්වහන්සේගේ නාමයෙන් යාච්ඤා කරමි.<br>ආමෙන්. |